www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි - All Rights Reserved

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

**Grade 8 – Second Term Test – July 2019**

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 8 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

# Buddhism - I

# බුද්ධ ධර්මය – I

Name :- ...................................................... Grade : -............... Index number:-...................

❖ ප්‍රශ්න සියල්ලමට පිළිතුරු සපයන්න.

01. බුදුරජාණන් වහන්සේ "යෝවද තම්පව රෝ මණු පේසු" යන ගාථාව දේශනා කළේ කාට ද?

(i) අනේසිඬු සිටු තුමාට. (ii) පොක්ඛරසාතී බමුණාට.

(iii) ඡත්ත මානවකයාට. (iv) රාහුල කුමරුට.

02. අප දෙදෙනාගෙන් යමෙකු පළමුව විමුක්තිය ලද හොත් ඒ බව අනෙකාට දැක්විය යුතු යයි එකගතාවට පැමිණුනේ,

(i) සැරියුත් මුගලන් (ii) සංජය පරිබ්‍රාජකයා සහ පොක්ඛරසාති බමුණා

(iii) උපතිස්ස කෝලිත (iv) තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන්

03. බුදුරජාණන් වහන්සේ දීඝනඛ පිරිවැජියාට දේශනා කළ සූත්‍රය,

(i) රතන සූත්‍රය (ii) වසල සූත්‍රය

(iii) වේදනා පරිග්ගහ සූත්‍රය (iv) කරණීය මෙත්ත සූත්‍රය

04. ප්‍රමාදව වාසය කළ ද පසුව නොපමාව කටයුතු කරන්නා වලා ගැබින් මිදුණු සඳ සේ ලොව බබලවන බව ප්‍රකාශ කළේ,

(i) අංගුල්මාල තෙරුණ් අරහයා. (ii) සම්බුජ්ජනී තෙරුන් පදනම් කර ගනිමිනි.

(iii) චිංචි මානවිකාව පදනම් කරගෙනය. (iv) අනඳ තෙරුන් පදනම් කරගෙනය.

05. සේඛියා ධර්ම සඳහන්ව ඇත්තේ,

(i) අභිධර්ම පිටකයේ ය. (ii) ධම්ම පදයේ ය.

(iii) ජාතකා කථා පොතේ ය. (iv) විනය පිටකයේ ය.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

06. නිගණ්ඨ නාථ පුත්‍රගේ ප්‍රධාන දායකයා වූයේ,

(i) දේවදත්තය. (ii) උපලි ගෘහපතියාය.

(iii) සිගාල බමුණාය. (iv) සංජය බෙල්ලට්ඨ පුත්ත ය.

07. තමා උපමාකර අන් අයට පීඩා නොකළ යුතු බව දේශනා කර ඇත්තේ,

(i) වේලුද්වාර සූත්‍රයේ ය. (ii) වේදනා පටිග්ගහ සූත්‍රයේ ය.

(iii) රතන සූත්‍රයේ ය. (iv) කරණීය මෙත්ත සූත්‍රයේ ය.

08. පරිමණ්ඩලය යන්නෙන් අදහස් වන්නේ,

(i) ප්‍රභා මණ්ඩලයයි. (ii) රැස් වළල්ලයි.

(iii) වටකොට ඇඳීම හා පෙරවීමය. (iv) සංවර බවය.

09. බෞද්ධ ඉගැන්වීම් තුළ"මදය" යනුවෙන් අදහස් වන්නේ,

(i) මත් වීමය. (ii) ක්ලාන්තය ය.

(iii) ප්‍රමාද වීම. (iv) සිතේ ප්‍රකෘතිය වෙනස් වීම.

10. රජගහනුවර පිහිටි ලේනුන් උදෙසා තැනූ අභය භූමිය,

(i) කලන්දක නිවාපයයි. (ii) නන්දන උයනයි.

(iii) මදාරා උයනයි. (iv) මිගදායයි.

11. මරණය සිදුවන ක්‍රම හතරක් බුදු දහමේ සඳහන් වේ. ඒ අනුව උපච්ඡේදක මරණයක් යනු,

(i) වයස්ගත වීමෙන් සිදුවූ මරණයක්. (ii) කර්මය අවසන් වීමෙන් සිදුවූ මරණයක්.

(iii) සිත පමණක් මියයාම. (iv) හදිසි අනතුරක් නිසා සිදුවූ මරණයකි.

12. චතුරාර්ය සත්‍ය විස්තර කෙරෙන සූත්‍රය,

(i) රථන සූත්‍රයයි. (ii) වසල සූත්‍රයය.

(iii) රාහුලෝවාද සූත්‍රයයි. (iv) ධම්ම චක්කපවත්තන සූත්‍රයයි.

13. බෞද්ධ ඉගැන්වීම් තුළ "සමුදය" යනු,

(i) තන්හාවයි. (ii) දුකයි.

(iii) සහජීවනයයි. (iv) සාමයයි.

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

14. තෘෂ්ණාව තුන් ආකාර වේ. ඒ අනුව විභව තණ්හාව යනු,

(i) යලි උපතක් නැතැයි සිතා ජීවිතය වින්දනය කිරීමයි.

(ii) යම් පදාර්තයක අන්තර්ගත ශක්තියයි.

(iii) යලි යලි ඉපදෙමින් සැප විඳීමට සිතීමයි.

(iv) මරණයට ඇති කැමැත්තයි.

15. තෘෂ්ණාවේ ප්‍රභේදයක් වන භව තණ්හාව ඇති වීමට හේතුව,

(i) ශාස්වත දෘෂ්ඨිය නිසා ඇතිවේ. (ii) උච්ඡේදවාදය නිසා ඇතිවේ.

(iii) බහු භාණ්ඩික බව නිසා ඇතිවේ. (iv) අවිහිංසාවාදය නිසා ඇතිවේ.

16. බෞද්ධ ඉගැන්වීම් තුළ "කර්ම" ලෙස හැඳින්වෙන්නේ,

(i) සචේතනික ක්‍රියාය. (ii) අකුසල කර්මයන් ය.

(iii) පුන්‍ය කර්මයන් ය. (iv) කුසල ක්‍රියා ය.

17. සිව්වැනි සතර සංග්‍රහ වස්තුව,

(i) මෙත්තාවය. (ii) කරුණාවය.

(iii) සමානාත්මතාවය. (iv) උපේක්ෂාවය.

18. බුදු දහමේ දැක්වෙන පරිදි ඉඳුරන්,

(i) හයකි. (ii) පහකි.

(iii) දහයකි. (iv) තුනකි.

19. දිව්‍ය පුත්‍රයෙකු වී ඉපදීමට මට්ඨකුණ්ඩලීට හේතු වූයේ,

(i) කයින් සිදු කළ කුසලයයි. (ii) වචනයෙන් සිදු කළ කුසලයයි.

(iii) සිතින් සිදු කළ කුසලයයි. (iv) පන්සිල් පද පහ රැකීමය.

20. අත්තුපනායික ධර්ම පර්යාය යනු,

(i) පන්සිල් රැකීමය. (ii) තමා උපමා කොට අනුන් නොරිද්දවීමය.

(iii) සමානාත්මතාවය. (iv) උපේක්ෂාවය.

(ලකුණු 2 × 20 = 40 යි.)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

## II කොටස

❖ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු ලියන්න.

01. (i) බුදුරජාණන් වහන්සේ දැහැමින් ගැටළු විසඳූ අවස්ථා දෙකක් දක්වන්න. (ලකුණු 02)

(ii) "ඉඳ ඉඳ එක වෙහෙර" වශයෙන් දක්වන ගුත්තිල කාව්‍යයේ සඳහන් කවිය කවර චරිත දෙකක පැවැත්ම පදනම් කරගෙන රචනා කරන ලදද? (ලකුණු 02)

(iii) දේවදත්ත කුමරු සමඟ පැවිද්ද ලබාගත් තවත් කුමාරවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(iv) කාන්තාවන්ට පැවිද්ද ලබාදීමට විරුද්ධව එකල සමාජයේ පැවති මතවාද දෙකක් ලියන්න. (ලකුණු 02)

(v) අෂ්ට ගරු ධර්ම දෙකක් ලියන්න. (ලකුණු 02)

(vi) චූල්ල පන්තක හිමියන්ට රහත් භාවයට පත්වීමට හේතු වූ සුදු රෙදිකඩක් පිරිමැදීම සම්බන්ධ සිදුවීමේදී සත්‍යාවබෝධයට හේතුවූ සිතුවිල්ල කුමක් ද? (ලකුණු 02)

(vii) බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑම සඳහි සූදනම් වූ අවස්ථාවේදී ධර්මය පිළිබඳ සැකයක් දුරු කර ගැනීමට පැමිණි පරිබ්‍රාජකයා කවරෙක් ද? (ලකුණු 02)

(viii) අතීත ශ්‍රී ලංකාවේ අවමංගල චාරිත්‍රයක් ලෙස රාත්‍රිය පුරා කියවන්නට යෙදුනු ජාතක කථාවක් හා සූත්‍රයක් ලියන්න. (ලකුණු 02)

(ix) බෞද්ධ සමාජය තුළ පුද්ගලයෙකුගේ උපතේ සිට මරණය දක්වා ජීවිතයේ විවිධ අවස්ථාවන්හි බොදු සිරිත් විරිත් මූලික කර ගැනේ. එවන් අවස්ථා දෙකක් දක්වන්න. (ලකුණු 02)

(x) බුදුගුණ භාවනාවේ ආනිශංස දෙකක් ලියන්න. (ලකුණු 02)

02. (i) නන්ද තෙරුන්ගේ කථාවේ අන්තර්ගත හරයන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පහත යෙදුම්වල සරල අර්ථය ලියන්න. (ලකුණු 03)

- අබ්භාකුටික
- උත්ථානමුඛ
- සම්මෝදක

(iii) බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් හෙළිවන ආචාරශීලී පැවතුම් පහක් නම් කරන්න. (ලකුණු 05)



Agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

03. (i) ධර්මයෙහි ගුණ කීය ද? (ලකුණු 02)

(ii) දහම් ගුණ වන්දනා කරන ගාථාව ලියන්න. (ලකුණු 03)

(iii) ඒ ගාථාවේ සඳහන් ගුණ අතරින් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) පිරිත් පින්කමකදී සකස් කරන "රාජ ගහ" සහ "වලයම" යනු මොනවා දැයි පැහැදිලි කරන්න.

- රජ ගහ -
- වලයම - (ලකුණු 02)

(ii) පහත ගාථාව සම්පූර්ණ කරන්න. (ගාථාව පිළිතුරු පත්‍රයේ පිටපත් කරගන්න.)

"සුප්පබුද්ධං පබුජ්ඣන්ති - ..................................................

.................................................. - .................................................."

(ලකුණු 03)

(iii) එහි තේරුම ලියන්න. (ලකුණු 05)

05. (i) ඒක ධම්මං අතීතස්ස - ..................................................

.................................................. - නත්ථි පාපං අකාරියං" (ලකුණු 02)

(ii) එම ගාථාවේ අර්ථය ලියන්න. (ලකුණු 03)

(iii) මත් ද්‍රව්‍ය නිසා පුද්ගලයාට ඇතිවන හානි පහක් ලියන්න. (ලකුණු 05)

06. (i) සිඟාල ගෘහපතියාට සමාජ සබඳතා පිළිබඳව දේශනා කළ සූත්‍රය කුමක් ද? (ලකුණු 02)

(ii) බ්‍රහ්ම විහරණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) සැමියා විසින් බිරිඳට ඉටුකළ යුතු යුතුකම් පහ ලියන්න. (ලකුණු 05)

07. වරහන් තුළ දී ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

(බුද්දක / මහෞෂධ / තුන්වන / උම්මග්ග / බුද්ධ වචනය සඳහා සපයන ලද අර්ථකථන සමූහය / ජාතක පාලිය / පාලි ත්‍රිපිටකය / පන්සිය පනස් ජාතක පොත / කුරුණෑගල / සූත්‍ර)

(i) ක්‍රි. පූ. .................................................. සියවසේදී සිදුවූ මහින්දාගමනයත් සමග .................................................. හා අටුවා ලංකාවට දායාද විය. (ලකුණු 02)

(ii) අටුවා යනු .................................................. ය. (ලකුණු 01)

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

www.agaram.lk
සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

(iii) .................................... පිටකයේ .................................... නිකායට අයත් ග්‍රන්ථ පහලවකි. (ලකුණු 02)

(iv) ඉන් එකක් වූ .................................... ට සකසන ලද අට්ඨකථා සමූහය ජාතකට්ඨ කතාවයි. (ලකුණු 01)

(v) එය .................................... යුගයේදී සංස්කරණය කරන ලද්දේ .................................... නමිනි. (ලකුණු 02)

(vi) .................................... ජාතකය දේශනා කරන ලද්දේ බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥා මහිමය ප්‍රකාශ කරනු පිණිසය. (ලකුණු 01)

(vii) එහි බුදුරජාණන් වහන්සේගේ පෙර ආත්ම භවය .................................... නම් වූ පඬිවරයාගේ චරිතයයි.

08. (i) චතුරාර්ය සත්‍යය නම් කරන්න. (ලකුණු 02)

(ii) දුක්ඛ සත්‍යය පිළිබඳ ආකාර තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) පංචස්කන්ධය නම් කරන්න. (ලකුණු 05)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk